**ආයතනයක වගතුග**

## කාලගුණ, දේශගුණ වෙනස්වීම් කලින් ම හෙළිකරන

# කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ඡායාරූප :- ටී. ඩී. සිරිසේන

**සමන්ත මල්ලවආරච්චි**

"බස්නාහිර, සබරගමුව හා දකුණු පළාත්වල හෙට අපර භාගයේ තැනින් තැන තද වැසි ඇති විය හැකි අතර දිවයිනේ සෙසු පළාත්වල කඩින් කඩ වැසි ඇතිවිය හැකි ය. වෙරළාසන්න ප්‍රදේශවල තද සුළං ද පැවතිය හැකි යි..."



රේඩාර් පරාවර්තනය සහිත බැලූනය ගුවනට මුද හැරීමට සූදනම් වන ෆ්‍රැන්සිස් සිල්වා මහතා

මෙවැනි නිවේදනයක් රූපවාහිනියෙන් හෝ ගුවන්විදුලියෙන් හෝ අසත් ම එසේත් නැතිනම් පුවත්පතකින් කියවත් ම එක්වරම යම් ආයතනයක් වෙත අපගේ මතකයට නැගෙයි. ජන ජීවිතය හා බැඳී පවතින මෙම ආයතනය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යි. මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන නිවේදන අතිශය තීරණාත්මක ය. වැදගත් ය. කාලගුණ තොරතුරු ඒ තරමට ම අපට අත්‍යවශ්‍ය ය.

ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ හා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ප්‍රමිතීන්ට අනුව කාලගුණ පරාමිති නිරීක්ෂණය කොට හා එක්රැස් කොට කාලගුණය හා දේශගුණය සම්බන්ධව අධ්‍යයනය කිරීම, දෛනික කාලගුණ තොරතුරු ලබාදීම, අයහපත් කාලගුණ අවස්ථාවල අනතුරු ඇඟවීම් කිරීම, වාරිමාර්ග කෘෂිකාර්මික, ජල පරිපාලනය, නාවික, ධීවර හා සිවිල් ගුවන් සේවා කාර්යන් සඳහා කාලගුණ විද්‍යා තොරතුරු සැපයීම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යය යි. එසේ ම භූ චුම්භකත්වය නිරීක්ෂණය කිරීම, භූ කම්පන හා තාරකා විද්‍යාව පිළිබඳ සීමිත සේවාවන් ද, කාලගුණය, දේශගුණය හා දේශගුණික වෙනස්වීම පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණවලට අනුබලදීම, සංවර්ධනය හා රක්ෂණය වැනි විවිධ කටයුතුවලට තොරතුරු ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව ඉටු කරයි.

මෙම සේවාවන් සැපයීමේදී දිවයින පුරා දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 19 ක් ද, වෙනත් ආයතන හා ස්වේච්ඡා සේවකයන්ගේ ආධාර ඇතිව කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 38 ක් ද, වර්ෂා මාන මධ්‍යස්ථාන 400 ක් ද



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ජ්. ඩබ්ලිව්. මොහොට්ටාල මහතා

ආධාර කර ගනියි. නිරීක්ෂණ දත්ත හා අනෙකුත් කාලගුණ තොරතුරු හුවමාරු කිරීමේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන මධ්‍යස්ථානය වන කොළඹ හා කලාපයේ ප්‍රධාන මධ්‍යස්ථානය වන නවදිල්ලිය අතර ශ්‍රී ලංකාව සඳහා ම වෙන් කළ සංනිවේදන පරිපථයක් ආධාර කර ගනියි. ලංකාව අවට මුහුදේ ගමන් කරන නෞකාවලින් ගනු ලබන කාලගුණ නිරීක්ෂණ දත්ත, විදුලි සංදේශ දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන කොළඹ ගුවන් විදුලි වෙරළාසන්න සේවය මගින් ලබා ගනියි. මහා බ්‍රිතාන්‍යයේ බ්‍රැක්නේල් හි කාලගුණ විද්‍යා



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී. එච්. ජයතිලක බණ්ඩා මහතා

කාර්යාලයෙන් විසුරුවා හරින සියලුම තොරතුරු ඇමෙරිකාවේ නෝආ (NOAA) 12, 14 හා 15 සහ ජපානයේ GMS - 5 චන්ද්‍රිකා ඔස්සේ ඍජුව ම ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයට ලබා ගැනෙයි. මේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දෛනිකව ඉටු කරන ක්‍රියාකාරකම්වල සංක්ෂිප්ත සටහනකි.

අද පවත්නා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ස්වාධීන ආයතනයක් බවට පත් වූයේ අදට වසර 52 කට ආසන්න කාලයකට පෙරදී ය. එනම් 1948 වසරේ ඔක්තෝබර් මස 01 වැනිද ය. එහි ආරම්භක අධ්‍යක්ෂවරයා වූයේ ආචාර්ය ඩී. ටී. ජ්. දසනායක මහතා ය. එහෙත් මෙම දෙපාර්තමේන්තුව සඳහා අඩිතාලම වැටුණේ වසර 150 කට පමණ ඉහතදී ය. 1850 වසර හෝ ඊට ආසන්න කාල වකවානුවකදී පේරාදෙණියේ සිවිල් ඉංජිනේරු හා මහා මාර්ග කොමසාරිස් කාර්යාලයේ සහ කොළඹ රාජකීය ඉංජිනේරු නිරීක්ෂණාගාරයෙහි කාලගුණ නිරීක්ෂණ පැවැත්විණි. මිනුම් දෙපාර්තමේන්තුවට අනුබද්ධව කාලගුණ විද්‍යා අංශය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ක්‍රමවත්ව කාලගුණ දත්ත නිරීක්ෂණය කිරීම



**උෂ්ණත්වය, ආද්‍රතාවය හා පීඩනය ආදී තොරතුරු ලබාදෙන රේඩියෝ සොන්ඩ් උපකරණය අතැතිව සිටින කාලගුණ විද්‍යා නිලධාරී මහේෂ් සුචරිතරත්න මහතා (මෙම උපකරණ බැලූනය සමග ගුවන් ගත කෙරේ.)**

කාලයේ මිනුම්පතිව සිටි කර්නල් ෆයර්ස් මහතා ගේ කාලවකවානුවේ ය. ඔහු මිනුම්පති ලෙස වැඩ භාරගෙන වසරක් යෑමට පෙර කාලගුණ නිරීක්ෂණ ක්‍රමවත්ව ලබා ගැනීමේ අරමුණින් දිවයින පුරා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගණනාවක් ඇති කළේ ය. 1867 වසරේදී රත්නපුර, බදුල්ල හා හම්බන්තොට ද, 1968 වසරේ දී කොළඹ, පුත්තලම, මන්නාරම, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, ගාල්ල, අනුරාධපුරය, මහනුවර හා නුවරඑළියේ ද කාලගුණ විද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථාන ආරම්භ කෙරිණි. 1907 වසරේදී කොළඹ නිරීක්ෂණාගාරය ආරම්භ වීමත් සමගම කාලගුණ විද්‍යා කටයුතුවලට විශේෂිත තැනක් හිමි වුණි. එය බෞද්ධාලෝක මාවතේ දැනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති ස්ථානයෙහි ම ආරම්භ වීම ද විශේෂ සිදුවීමකි.

සහකාර මිනුම්පති වරයකු වූ එම්. ඩී. බර්නාඩ් මහතා ගේ සහයට 1908 දී පැමිණි ඒ. ජේ. බැම්ෆර්ඩ් මහතා නිරීක්ෂණාගාරයේ මුල්ම පූර්ණකාලීන විද්‍යාත්මක නිලධාරියා විය. එතෙක් පවත්වාගෙන ආ කාලගුණ නිරීක්ෂණ වලට අමතරව භූ චලන නිරීක්ෂණ පැවැත්වීම හා සම්මත වේලාව සැපයීමේ කටයුත්ත ද, 1909 දී ආරම්භ කරන ලද අතර වැලිකඩ ගුවන් විදුලි සම්ප්‍රේෂණ ස්ථානය හරහා පළමු කාල සංඥාව විසුරුවා හරිනු ලැබුවේ ද 1909 දී ය.

1913 බර්නාඩ් මහතා විශ්‍රාම යාමෙන් අනතුරුව නිරීක්ෂණාගාරයේ අධිකාරී තනතුරට බැම්ෆර්ඩ් මහතා පත් විය. ඉහළ වායුගෝලයේ සුළගේ වේගය හා දිශාව මැනීමට නියාමක බැලූන නිරීක්ෂණ 1922 දී කොළඹින් ආරම්භ කළේ ය. 1931 බැම්ෆර්ඩ් මහතා විශ්‍රාම ගිය අතර එම තනතුරට පත්වූ එච්. ජේම්සන් මහතා 1939 තෙක් අධිකාරී තනතුරේ වැඩ කටයුතු කරන ලදී. මේ වකවානුව තුළ එනම් 1934 වසරේ භූ චුම්බක නිරීක්ෂණ ආරම්භ කරන ලද අතර 1937 කොළඹ මද්‍රාසි ගුවන් ගමන් ආරම්භ කිරීමත් සමග එයට අවශ්‍ය ඉහළ වායු දත්ත ලබාගැනීම සඳහා නියාමක බැලූන් නිරීක්ෂණ මන්නාරමෙහි ද ආරම්භ කරන ලදී.

1939 අගෝස්තු 31 වැනි දින ජේම්සන් මහතා විශ්‍රාම යාමත් සමගම ආචාර්ය ඩී. ටී. ඊ. දිසානායක මහතා නිරීක්ෂණාගාරයේ අධිකාරී තනතුරට පත් විය. මොහු එම තනතුරට පත්වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා ද වේ. ආචාර්ය දසනායක මහතා ගේ කාලයේ සිවිල් ගුවන් සේවා කටයුතුවලට අවශ්‍ය කාලගුණ තොරතුරු ලබාදීමට රත්මලාන ගුවන් තොටුපළේ කාලගුණ විද්‍යා කාර්යාලයක් 1946 අගෝස්තු මාසයේ ආරම්භ කරන ලද අතර එම වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී කොළඹ වරායේ ද කාලගුණ විද්‍යා කාර්යාලයක් ආරම්භ කෙරිණි. දෙවැනි ලෝක යුද්ධ සමයේ යුද්ධ අවශ්‍යතාවන් සඳහා ත්‍රිකුණාමලේ තාවකාලිකව පවත්වාගෙන ගිය නියාමක බැලූන් නිරීක්ෂණ නිතිපතා පවත්වාගෙන යාම 1947 දී පටන් ගැනිණ. කොළඹ හම්බන්තොට හා ත්‍රිකුණාමලයෙන් ලබාගන්නා නිරීක්ෂණ, ගත්ගුත් කාලගුණ විද්‍යා ආයතනයට සම්ප්‍රේෂණය කර යැවීම 1947 පෙබරවාරි 23 ද ආරම්භ කරන ලද අතර එම වර්ෂයේ ම ඔක්තෝබර් 24 ද සිට කොළඹට නැව් වලින් ලැබෙන කාලගුණ නිරීක්ෂණ, කරච්චි නුවර නිරීක්ෂණාගාරයට යැවීම ද ඇරඹිණි. සිවිල් ගුවන් සේවා කටයුතු හා අනෙකුත් සංවර්ධන කටයුතුවල අවශ්‍යතාවන්ට සරිලන පරිදි වැඩ කටයුතු පුලුල් කිරීම මේ කාලයේ සිදු විය.

ස්වාධීන ආයතනයක් බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පත්වූ 1948 සිට අද දක්වා එහි අධිපති ධූරයට නියමුවන් පහළොස් දෙනෙක් පත් වූහ. වත්මන් අධ්‍යක්ෂවරයා වන්නේ ආචාර්ය ඒ. ඩබ්ලිව්. මොහොට්ටාල මහතා ය. ඔහු අප හා අදහස් දක්වමින්,

"1948 වසරේ දී පාර්ලිමේන්තු" පනතකින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කෙරුණා. කාලගුණ දත්ත රැස් කිරීම අවශ්‍ය සෑම පහසුකමක් ම අප සතුයි. උෂ්ණත්ව මැනීමේදී මීට පෙර සිට ම පාවිච්චි කළේ රසදිය මාපකය යි. නිවැරදිව තොරතුරු ඉන් ලබා ගත හැකි යි. නවීන තාක්ෂණය ඔස්සේ නිපදවා ඇති විද්‍යුත් උපකරණවලින් ද එය කළ හැකියි. ඒවගේ ම ඒවා වියදම් සහිත යි. එම උපකරණයේ පරිපථයක වැරැද්දක්, දුර්වලතාවක් සිදු වුවහොත් වැරදි තොරතුරු ලබා දෙනවා. නමුත් රසදිය මාපකය විශ්වාසනියත්වයකින් භාවිත කළ හැකි යි. ජිනීවා මූලස්ථානය කොට ගත් ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ ශ්‍රී ලංකාව ද සාමාජිකයෙක්. එයට අප ඇතුළුව රටවල් 180 ක් සම්බන්ධව සිටිනවා. මේ සෑම රටක් ම එකම ජාලයකින් බැඳිලා. ශ්‍රී ලංකාවේ සම වේලාවකට කාලගුණ දත්ත රැස් කරන්නේ නම් ලෝකයේ අනෙකුත් සාමාජික රටවල් ද එම වෙලාවටම එකී තොරතුරු රැස් කරනවා. එම සියලු තොරතුරු ගෙන සිතියම් ගත කළා ම පවත්නා තත්ත්වය පිළිබඳ නිරූපණය වෙනවා. හරියට ගුවනේ සිට පොළව දෙස බැලුවා වගේ. දිවයින පුරා ඇති අපේ මධ්‍යස්ථාන 22 න් ක්‍රියාකාරී මට්ටමේ පවතින්නේ මධ්‍යස්ථාන 19 ක් පමණයි. පවත්නා තත්ත්වය නිසා උතුරේ මධ්‍යස්ථාන 3 අක්‍රිය යි. සෑම පැය 3 කට වරක් ම



**ගුවන් ගත කළ බැලූනයේ ගමන් මග පරිගණක ඔස්සේ පිරික්සන කාලගුණ විද්‍යාඥ සුනිල් සිල්වා, ඉලෙක්ට්‍රොනික තාක්ෂණ නිලධාරී ආනන්ද පීරිස් හා තාක්ෂණ නිලධාරී ජේ. ජේ. විමලසේන යන මහත්වරු**



**සී. හෙට්ටිආරච්චි, ඩී. එම්. බී. සුරවීර, අයි. බී. ඒකනායක හා එන්. රඝුප්පතගේ යන මහත්වරු විසින් ලැබෙන දත්ත ඇතුළත් කොට සිතියම් ගත කරන්නේ මෙහිදී ය.**



කාලගුණ අනාවැකි නිකුත් කිරීම සඳහා දත්ත පිරික්සන සේවයේ නියුක්ත කාලගුණ විද්‍යාඥ ශිරෝමනී ජයවර්ධන මෙනෙවිය



සංඥ නිලධාරිනි ලලිතා රාජපක්ෂ මහත්මිය පරිගණක මගින් තොරතුරු සොයා බලන අයුරු නිරීක්ෂණය කරන ප්‍රධාන සංඥ නිලධාරී ඩබ්ලිව්. ඒ. කරුණාදස මහතා

තොරතුරු රැස් කරලා කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානයට ලබා ගන්නවා. වාතයේ උෂ්ණත්වය, පීඩනය, සුළඟේ දිසාව හා එහි වේගය, වලාකුළුවල තත්ත්වය දැනට පවතින කාලගුණ තත්ත්වය, පසුගිය පැය 6 තුළ පැවැති කාලගුණ තත්ත්වය හා දෘශ්‍යතාව ආදී තොරතුරු රැස් කරනවා. එකී තොරතුරු සංකේත ආකාරයට යි ලබා ගන්නේ. අපගේ කලාපීය මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ නවදිල්ලියේ යි. අපේ රටේ තොරතුරු නවදිල්ලි මධ්‍යස්ථානයට යවනවා. අනෙකුත් රටවල් ද එලෙස යවනවා. එමගින් ලෝකයේ අනෙකුත් මධ්‍යස්ථාන ඔස්සේ සියලු සාමාජික රටවලට යවනවා.

අපට කිසියම් රටක කාලගුණ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය නම් නවදිල්ලිය මධ්‍යස්ථානය ඔස්සේ ලබා ගන්නවා. මේ සියලු තොරතුරු ලබා දෙන්නේ අපටම වෙන්කරන ලද විද්‍යුත් පරිපථයක් මගිනු යි. නවදිල්ලි මධ්‍යස්ථානය ඔස්සේ ලැබෙන තොරතුරු සෘජුව ම කටුනායක ගුවන් තොටුපළේ පිහිටි අපේ මධ්‍යස්ථානයට යනවා. ඒ වගේ දිවයිනේ අනෙකුත් මධ්‍යස්ථාන වලින් ලැබෙන තොරතුරු ද එම මධ්‍යස්ථානයට ලබා දෙනවා. ගුවන් තොටුපළේ දී ගුවන් ගමන් සඳහා දත්ත අවශ්‍යවන නිසා පැය 1/2 කට වරක් නිරීක්ෂණ කටයුතු සිදු කරනවා. එම තොරතුරු ගුවන් ගමන් පාලක මැදිරිය ඔස්සේ අවට ගුවන් තොටුපළවලට ද ලබා දෙනවා.

කාලගුණ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී කිසිම රටකට 100% ක් ම නිවැරදිව කීමට හැකියාවක් නැහැ. අපටත් එහෙම යි. පැවැති හා පවත්නා දත්ත මත අත්දැකීම් හා පළපුරුද්ද මතින් අපේ නිලධාරීන් එය ප්‍රකාශ කරනවා. දවසේ පැය 24 පුරා ම රාජකාරියේ නියුක්තව සිටින කාලගුණ විද්‍යාඥයින් මගින් ඕනෑම අයකුට කාලගුණික තොරතුරු ලබා ගත හැකි යි. පරිගණක ආධාර කරගෙන ඉදිරියේ දී තොරතුරු ඉදිරිපත් කිරීමට සැලසුම් කොට තිබෙනවා.

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කොට තිබේ. දෙපාර්තමේන්තුවට අදාළ සියලුම කාලගුණ මෙහෙයුම් ක්‍රියාදාමයන් සිදුවන්නේ එහි ය. එම මධ්‍යස්ථානයේ ක්‍රියාදාමයන් පිළිබඳව එහි ප්‍රධානත්වය හොබවන නියෝජ්‍ය අධ්‍යක්ෂ **පී. එම්. ජයතිලක බණ්ඩා** මහතා මෙසේ කීය. ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ කාර්යයන් කොටස් ත්‍රිත්වයකට බෙදෙනවා.

1– කාලගුණ විද්‍යා දත්ත රැස්කිරීම

2– එකී දත්ත සිතියම් ගත කිරීම

3– කාලගුණ විද්‍යා අනාවැකි ප්‍රකාශ කිරීම

අපේ මධ්‍යස්ථාන හා නවදිල්ලිය ඔස්සේ ලැබෙන තොරතුරු මගින් නිසි දත්ත ලබා ගන්නවා. ඒවා ආශ්‍රයෙන් සිතියම් ගත කිරීම සඳහා ලබා ගත් දත්ත යොමු කරනවා. සියලු දත්ත ලබා ගැනීමේ පාදක වෙලාව ග්‍රිනිච් වේලාවේ 00 ලෙස ගැනෙනවා. ඒ අනුව සියලු රටවල් ද එය පාදක කොට තොරතුරු රැස් කරනවා. දත්ත ආශ්‍රයෙන්

1. භූතල මට්ටමේ සිතියම් 4 ක් සෑම පැය 6 කට වරක් සකස් කරනවා

2. ඉහළ වායුගෝලයේ විවිධ මට්ටම් ඇතුළත් සිතියම් සෑම පැය 12 කට වරක් ම සකස් කරනවා.

3. දේශීය මධ්‍යස්ථාන ඔස්සේ ලැබෙන දත්ත ආශ්‍රයෙන් සෑම පැය 3 කට වරක් ම සිතියම් සකසනවා

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නැරඹීම සඳහා නියමිත දිනට සති 3 කටවත් කලින් ලිඛිතව ඉල්ලීමක් කරන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ඩබ්ලිව්. මොහොට්ටාල මහතා ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

වාර්ෂිකව ලක්ෂයකට ආසන්න පිරිසක් තම දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණෙන නිසා ඇතිවන අපහසුතා මඟ හැරීමේ අරමුණින් මෙම ඉල්ලීම කරන බව ආචාර්ය මොහොට්ටාල මහතා කීය. ඉල්ලුම් කරන නියමිත දිනටය අදාළ නරඹන්නන් සඳහා ලබා දීමට නිතරම උත්සහ ගන්නා අතර නදබදයක් පවතින විට එය වෙනත් දිනයකට මාරු කිරීමට සිදුවන බව ද හෙතෙම කීය. දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණෙන සියලු දෙනාට ඒ සඳහා සුවපහසු ලෙස අවකාශ සැලසීම තමන් ගේ අරමුණ බවද අධ්‍යක්ෂවරයා කීය.



ගුවන් ගමන් සඳහා අවැසි කාලගුණ තොරතුරු පරිගණක මගින් පිරික්සන කාලගුණ විද්‍යාඥ එස්. එච්. කාරියවසම් සහ චන්ද්‍රිකා ජයාරූප පරිගණක මගින් විශ්ලේෂණය කරන කාලගුණ විද්‍යාඥ එස්. ආර්. ජයසේකර යන මහත්වරු



සුළඟේ වේගය හා දිසාව පරීක්ෂාකරන අභ්‍යාසලාභී නිරීක්ෂණ ඩබ්ලිව්. පී. යූ. ජයසූරිය මහතා

# ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා ක්ෂේත්‍රයේ සිදු වූ සුවිශේෂ සිදුවීම් සමහරක්

1867-83 කර්නල් ෆයර්ස් මහතා විසින් කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථාන හා වර්ෂාමාන මධ්‍යස්ථාන පද්ධතියක් ඇති කිරීම

1907 කොළඹ නිරීක්ෂණාගාරය ඇති කිරීම

1909 භූ කම්පන මානයක් නිරීක්ෂණාගාරයේ සවිකිරීම

1909 වේලාව සැපයීමේ සේවාව ආරම්භ කිරීම

1922 කොළඹ නියාමක බැලුන් නිරීක්ෂණ ආරම්භ කිරීම

1946 ගුවන් සේවා කටයුතු සඳහා තොරතුරු සැපයීම ආරම්භ කිරීම

1948 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඇති කිරීම

1950 ගුවන් සේවා කටයුතු සඳහා කන්කසන්තුර ගුවන් තොටුපලේ කාලගුණ විද්‍යා කාර්යාලයක් අලුතින් ඇති කිරීම

1951 කොළඹ රේඩියෝ සොන්ඩ් නිරීක්ෂණ ආරම්භ කිරීම

1951 ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම

1951 රත්මලාන ගුවන් තොටුපලේ කාලගුණ නිමිති පළකිරීමේ ස්ථානයක් ඇති කිරීමෙන් ගුවන් සේවා සඳහා තොරතුරු සැපයීම රාජකීය ගුවන් හමුදාවෙන් පවරා ගැනීම

1952 ජාතික කාලගුණ විද්‍යා සම්ප්‍රේෂණ සේවාව රාජකීය ගුවන් හමුදාවෙන් පවරා ගැනීම

1952 මහඉලුප්පල්ලම කාලගුණ කාර්යාලය ඇතිකිරීම

1952 හම්බන්තොට නියාමක බැලුන් නිරීක්ෂණ ආරම්භ කිරීම

1956 කොළඹ රේඩාර් සුළං නිරීක්ෂණ ආරම්භ කිරීම

1957 වවුනියාව කාලගුණ විද්‍යා ස්ථානය ආරම්භ කිරීම

1960 කටුනායක කාලගුණ විද්‍යා කාර්යාලය රාජකීය ගුවන් හමුදාවෙන් පවරා ගැනීම

1972 ප්‍රධාන කාර්යාලයේ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය ඇතිකර එයට එතෙක් රත්මලාන කාර්යාලයෙන් ඉටු කළ නිමිති පළ කිරීමේ කටයුතු පැවරීම

1972 ස්විට්සර්ලන්ත රජයේ ආධාර ඇතිව කාලගුණ විද්‍යා සංනිවේදන ජාලය ඇතිකිරීම වැඩි දියුණු කිරීම හා ඉලෙක්ට්‍රොනික් වැඩ සඳහා කර්මාන්ත ශාලාවක් ඇති කිරීම

1972 අඟල් 10 යේ කැසග්‍රේන් දුරදක්නයක් දෙපාර්තමේන්තුවේ සවිකිරීම

1973 ඇමරිකා එක්සත් ජනපදයෙන් ලද චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීමේ උපකරණයක් කටුනායක ගුවන් තොටුපළ කාර්යාලයේ සවිකිරීම

1973 ප්ලෙසි රේඩාර් (PLESSY RADAR) යන්ත්‍රය කොළඹ සවි කිරීම

1973 කෘෂි කාලගුණ විද්‍යා අංශයක් ඇති කිරීම හා කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 20 ක් ඇති කිරීම

1973 කොළඹ - නවදිල්ලිය විදුලි සංදේශ පරිපථය ඇති කිරීම

1978 ඇමෙරිකාවේ නොආ (NOAA) ආයතනයෙන් ලබාදුන් චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීමේ උපකරණය සවිකිරීම

1979 මුලතිව් කාලගුණ විද්‍යා කාර්යාලය ඇතිකිරීම

1981 පොතුවිල් කාලගුණ විද්‍යා කාර්යාලය ඇතිකරීම

1982 ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ මැදිහත්වීමෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනින් ලබාදුන් කාලගුණ රේඩාර් යන්ත්‍රය ත්‍රිකුණාමලයේ සවිකිරීම

1986/87 කාලගුණ දත්ත පරිගණක ගත කිරීමේ ක්ලයිකොම් (CLICOM) ව්‍යාපෘතිය ආරම්භය.

1989 බණ්ඩාරවෙල නව කාර්යාලය ආරම්භ කිරීම ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ කලාපීය පරිගණක ජාලය යටතේ Microvax කොම්පියුටරයක් හා මෘදුකාංග ලබා ගැනීම

1992 WF.33 රේඩාර් යන්ත්‍රය ලබා ගැනීම

1993 රත්නපුර කාර්යාලය නව නගරයේ නව ගොඩනැගිල්ලට ගෙන යාම

1993 රේඩියෝ සොන්ඩ් නිරීක්ෂණ සඳහා ඉන්දියානු රජයෙන් නව උපකරණ ලබාදීම

1995 වවුනියාව නව කාර්යාලය ඉදිකිරීම හා නිරීක්ෂණ නැවත ආරම්භ කිරීම

1995 ලෝක ආහාර සංවිධානයේ ආධාර ඇතිව කොබ්බෑකඩුව ගොවි කටයුතු හා පර්යේෂණ ආයතනය හා එක්ව වෙළෙඳපොළ හා ආහාර තොරතුරු පිළිබඳ ව්‍යාපෘතිය පටන් ගැනීම

1996 හම්බන්තොට කාර්යභාර නිලධාරි නිල නිවාසය තැනීම

1996 ක්ලයිකොම් පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම

1996/97 අති විභේදනයකින් (High Resolution) යුතු චන්ද්‍රිකා ඡායාරූප ලබා ගැනීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම

1997 පොතුවිල් සහ කටුගස්තොට කාර්යභාර නිලධාරි නිල නිවාස ඉදිකිරීම

1998 බ්‍රැක්නෙල් කාලගුණ විද්‍යා කාර්යාලයෙන් චන්ද්‍රිකා හරහා විසුරුවා හරින දත්ත හා තොරතුරු ලබාගැනීමට අවශ්‍ය උපකරණ (SADIA) එක්සත් රාජධානි රජයෙන් ලබාදීම

1998 ඉන්දීය චන්ද්‍රිකාවෙන් ලබා ගන්නා චන්ද්‍රිකා ඡායාරූප හා එමගින් විසුරුවා හරින අනෙකුත් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය උපකරණ ඉන්දියා රජයෙන් ලබාදීම



නවදිල්ලි මධ්‍යස්ථානය මගින් ලබා දෙන තොරතුරු කටුනායක ගුවන් තොටුපල මධ්‍යස්ථානයට යැවීමට සූදානම් වන ඉලෙක්ට්‍රොනික තාක්ෂණ නිලධාරි පාලිත ද සිල්වා මහතා



නවදිල්ලි මධ්‍යස්ථානය මගින් ලබාදෙන තොරතුරු ටෙලිප්‍රින්ටරයෙන් මෙලෙස මුද්‍රණය වී නිකුත් වෙයි



පෘථිවියේ චන්ද්‍රිකා ඡායාරූපයක්



දිවයින පුරා පිහිටි මධ්‍යස්ථානවලින් කාලගුණික තොරතුරු ලබාගන්නා සංඥ නිලධාරි ඒ. සී. එම්. පායිස් මහතා